සුබස් සිතිවිලි

ය/යි හඬේත් වි/වු හඬේත් වෙනස

මිශ්‍ර සිංහල හෝඩියේ ඇති (අය්) ඓ, (අව්) ඖ, (ඊ) ඍ, (ඊඊ) ඎ, (ල්) ඕ (ල්ල්) ඕ යන ස්වර ශබ්ද කිරීමේ දී ඇති වන අවිලක් ගැන පලමුවෙන් අපි විමසා බලමු.

ඓස්/අය්ස්/අයිස් - මෛල්/මය්ල්/මයිල්, ඖල්/අව්ල්/අවුල් - දෞල්/දව්ල්/දවුල්, ඍෂි/ඊෂි/රිසි/රුසි - කෘෂි/ක්ඊෂි/ක්රුෂි/ක්‍රැෂි - පෞකුල/ල්කුල/ලුකුල - කැටෘ/කැට්ල් (කැටල් - ක්ඹඹබෑ), වැනි වචන වල ඇති ඓ, ඖ, ඍ, පෞ යන ස්වර බැහැර කොට අපේ ස්වර/අකුරු යොදා ලිවීම නිසා සමහර ගැටලු/අව්ල් ඇති නොවන හැටි තේරුම් ගනිමු.

ඓරාවන/ඓක්‍යය - තෛලය/දෛවය ලිවීමේදී 'ඓ' ස්වරය ගන්නේත් අය්ස් (අයිස්)/ අය්යා (අයියා) ලියන විට 'ඓ' නොගන්නේත් ඇය් ?

ඖෂධ/ඖදාර් - තෛලය/දෛවය ලිවීමේ දී - ඖ" ස්වරය ගන්නේත් අව්ව/අව්රුදු දව්ල/පව්ව ලියන විට "ඖ" නොගන්නේත් ඇය්.

ඍතු, ඍජු, ඍන, ඍශි ("ඍ" යන්නේ ඇත්තේ ඉරිත්ත/ ඉරිකෑල්ල නැති "ස" යන්නකි) යන වචන ඊතු, ඊජු, ඊන, ඊශ යනුවෙන් නිවැරදි ව නොකියා ඉර්තු/රිතු, ඉර්ජු/රිජු, රින/ස්රුන, ඉර්ශි/රුශි යනුවෙන් කෘශි, ගෘහ, තෘන, දෘඩ, මෘග, වෘක, හෘද වැනි වචන ක්ඊශි, ග්ඊහ, ත්ඊන, ද්ඊඩ, මිර්ග, හ්ඊද යනුවෙන් නිවැරදිව නොකියා ක්රුශි, ග්රුහ, ත්රුන, ද්රුඩ, මිරුග/මුර්ග, වුර්ක, හර්ද/හ්රුද යනුවෙනුත් කියවන්නේ ඇය් ?

ක්‍රෘර/ක්ඊර්ර ලියා ක්රූර/ක්‍රෑර යනුවෙනුත් ට්‍රෘමන්/ට්ඊර්මන් ලියා ට්රූමන් / ට්‍රෑමන් යනුවෙනුත් ට්‍රැක්ට/ට්රැක්ට, ප්‍රැන්සිස්/ප්රැන්සිස්, බ්‍රැන්ඩ්/බ්රැන්ඩ් ලියා ට්රැක්ට, ප්රැන්සිස්, බ්රැන්ඩ් යනුවෙනුත් කියවන්නේ ඇය් ?

ය් වීර්ල් (ය ව ර ල අන්ත:ස්ත) යන අංශවලට -ඇ" එකතු වී හැදෙන අකුරක් මිශ්‍ර සිංහලයේ දක්නට නැත යනු මගේ අදහසයි.

ක් ය් උ - ක්‍යු / ක් ය් ඇ - ක්‍යැ, ක් ඊ උ - ක්‍රැ / ක් ඊ ඇ - ක්රැ ?, ක් ල් උ - කලු / ක් ල් ඇ - කලැ, ක් වි උ - ක්‍වු /කවු / ක් වි ඇ - ක්වැ / කවැ යන සටහන අනුව -ක්‍රැ" ශබ්ද කරන්නේ -ක්රැ" යනුවෙන් බව පෙනේ.

අපි අන්ත:ස්ත (ය ර ල ව) සඳහා නිර්මානයක් කරමු.

ය/2 - ය අංශය - ‍ය, ර/2 - ර අංශය - 6, ල/2 - ල අංශය - 3, ව/2 - ව අංශය - 9. දැන් අපට ක්යැ, ක්රැ, ක්ලැ, ක්වැ ලිවීමේදී ගැට මතු නොවේ. ක්‍යැ, ක6ැ, ක3ැ, ක9ැ. මෙහි දී 6 3 9 ගත්තේ වෙනත් ලකුනු යතුරු පුවරුවේ නැති නිසාය. එවිට අපට (ය් අංශය) යංශය මෙන්ම රංශය, ලංශය, වංශය යනුවෙන් ලකුනු හතරක් ම හැදේ.

මේ අවිලට මුල ර අංශය (රකාරාංශය) ‍ු අකුරට යටින් ලිවීමය. ක්ර - ක්‍ර ලිවිය හැකිය. ර ැ - රැ නොවේ. ර ැ - රු කියවන්නේ ඊ උ - රු යනුවෙනි. පැත්ත මාරු කර 'ට' යන්නක් 'ර' වෙනුවට තිබිනි නම් ට්‍ර ර්‍ර ලියන්නට බැරි කමක් නැත. රැස, රැලි - රුස, රුලි වේ. රුව, රුදු - රුව, රුදු වේ.

දැන් ප්රැන්සිස්, ට්රැක්ට, බ්රැන්ඩ් ලියවෙන්නේ පරුන්සිස්, ටරුක්ට, බරුන්ඩ් යන විදියටය්.

අය්ස් යන වචනය "ඓස්" යනුවෙන් ලිවීම - මහාසාවජ්ජ අකුසල කරුමයක්" නොවේ. එවිට අය් ඉස් - අයිස් කියවෙන්නේ නැත.

ඓයා / අය්යා, කෛය/කය්ය, ජෛන/ජය්න, තෛල/තය්ල, දෛව/දය්ව, පෛය/පය්ය, බෛල/බය්ල, මෛල/මය්ල අපට කියවෙන වචන නිවැරදි ව ලියවෙන්නේ මෙසේ ලියු විටය.

ඖ/අව් යන්නද එසේමය. ඖව/අව්ව, කෞලු/කව්ලු, ගෞම/ගව්ම, තෞව/තව්ව, දෞල/දව්ල, පෞම/පව්ම, බෞන/බව්න, මෞන/මව්න යන වචන ද නිවැරදිව ලියවේ.

සකු වචනවලට පමනක් ඓ/ඖ යෙදිය යුතුය යන නීතියක් නැත. දෙමල, මුස්ලිම්, පරංගි, ලන්දේසි, ඉංගිරිසි, මැලේ(ජා) ලේ සහිත සිංහලයෝ අප අතර සිටිති.

දෙමල, සකු, මගද, අරාබි, පරංගි, ලන්දේසි, ඉංගිරිසි, (ජා) මැලේ වචන සිය දහස් ගනනින් අපේ බසට ඇතුලු වී ඇතත් අපේ බසේ සිංහල නමත් වෙනස් වී නැත.

ටෙලිවිස්නේ "පණහ" යන වචනයත් "සිවු" යන වචනයත් (අද) මම දුටුවෙමි. පස් දහස් පන්දහස් වේ, පස් සිය පන්සිය වේ. පස් දස පන්දස වේ. එය එතැනින් නොනැවතී පන් ද් අස - පනස වේ. අපේ රටේ න/ණ ල/ළ මත්තේ හැපෙන බස් ඉසුරත් ද "පණස" ලියා ඇති තැන් මා දැක ඇත. "දස" දස් යනුවෙන් වියහරට පැමින නැතත් "පනස" යන්න -පනස්" වී ඇත. එය -නෛරුක්තික" විදියට හැදී ඇත.

මට නොතේරෙන ගැටයක් මම ඔබට කියමි. එය තේරුම් ගෙන මට උපදෙසක් දෙතොත් මම අගය කරමි. මෙය විප්ලවකාරී අදහසකි. වෙ. වි. අබේගුනවර්දන පඬිතුමා තමා ලියු පොතක මා හඳුන්වා ඇත්තේ - විප්ලවකාරී ලේකකයකු ලෙසය. එහි ඇත්තක් නැත්තේද නොවේ.

විශ්වාස - අපවිත්‍ර - විනාශ - දුශ්‍ය - අවවාද යනු සකු වචන කිපයකි. අච්චු - අඩත්තේට්ටම් - අඩයාලම් - අඩක්කු - ඔට්ටු - කප්පම් - කුත්තු යනු දෙමල වචන කීපයකි. මේ වචන නාම පද ගනයට වැටේ. කරනවා - ගහනවා - අල්ලනවා - ගන්නවා වැනි ක්‍රියා පද එකතු කොට අපි ඒ වචන බාවිතා කරමු. කරගහනවා - අතගානවා - බඩගානවා යන වචන මෙන් ඉහත කී වචන වියහරේ පවතී.

බුක් කරනවා - කොල් කරනවා - ඕපන් කරනවා - බැට් කරනවා - බෝල් කරනවා

වි ක ධර්මබන්ධු

වැනි ඉංගිරිසි වචන දෙස අප බලන්නේ වපර ඇසිනි. ගෑල් (ගර්ල්) කෙනෙක්, බුක් එකක් ගැන කතා නොකල යුත්තේ අපේ වචන තිබෙන නිසාය. කාරෙක, බස්සෙක යනුවෙන් -එක" බාවිතා වෙතත් පෑන් එක, බෝතල් එක, කේතල එක වැනි වචන බාවිතා නොවේ. ඒවා පෑන, බෝතලය, කේතලය යනුවෙන් සිංහල වී ඇත.

බාම්, ජෙල්, ක්‍රීම්, ජේස්ට්, පියුරි, සෝස්, ලය්ට්, ෆ්ලය්ට්, ට්‍රිප්, සීන්, වීල්, ට්‍රක් ආදි එදිනෙදා බාවිතා වන වචනවලට සිංහල මුනතක් දැමීම යුතු ද අපේ ගැල යටපත් වී කරත්තයත්, පහන යටපත් වී ලාම්පුවත්, (වාසල) දෙරටුව වෙනුවට ගේට්ටුවත් පැමින ඇත.

ලක්ශ පනහ, කෝටි පනහ, මිලියන පනහ, දස ලක්ශ පනහ ගැන මී ලඟ ලිපියෙන් .....

Kelani Nadee Yatra - The longest and most successful environmental educational program ever run along a river in Sri Lanka

Kanchana Weerakoon recently led an amazing 12 day journey with 21 Sri Lankan youth down the Kelani River. Kanchana is founding president of Sri Lankan based environmental organisation Eco Friendly Volunteers (ECO-V) and co-founder for Journeys for Climate Justice (JCJ) which is based in Australia.

Come and hear Kanchana when she is visiting Australia. She will talk about her experience on this innovative project which targeted climate change mitigation and adaptation in Sri Lanka.

Kanchana will be sharing her experiences with the Melbourne community at a presentation, with photos, stories from youths, and a documentary film.

This is not the end of the journey for climate change challenges that Sri Lankans are facing. The Kelani Nadee Yatra team are initiating many new projects to do their duties for Mother Sri Lanka.

Date: Saturday 3rd December 2011 at 4:00 p.m.

Location: Mount Street Neighbourhood House Inc.

6, Mount Street
Glenn Waverley, Vic 3150
Melway Reference: Page 71 D2

For further details please contact Manjith on 0411702064

කොතැන සිටියත් සූරිය ඔබේ වෙළඳසලයි

කාන්සියට, රස වින්දනයට සිංහල ටෙලි නාට්‍ය

බටහිර ඔස්ට්‍රේලියාව, දකුණු ඔස්ට්‍රේලියාව, තස්මේනියාව, ක්වීන්ස්ලන්තය, නිව් සවුත් වේල්සය, කැන්බරා, වික්ටෝරියා ඔස්ට්‍රේලියාවේ කොයි අස්සක මුල්ලක හිටියත් ඔබට අවශ්‍ය සිංහල ටෙලි නාට්‍ය තැපෑලෙන් ගෙන්වා ගන්න...

අප අමතන්න
03 9465 8257

සූරිය Sooriya ඔබේ වෙළඳ සල

* conditions apply

132 - 1B Alexander Av Thomastown Vic 3074 Tel - 9465 8257
www.sooriya.com.au

සූරිය - හිරු මෙන් විශ්වාසයි